# බුද්ධ ධර්මය

10 - ශ්‍රේණිය



e තක්සලාව
The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa
Copyright © www.e-thaksalawa.moe.gov.lk

# පිළිතුරු

## 16 බුදු සිරිතයි - පරිසරයයි

1. ■ ජීව පරිසරය
   ■ අජීව පරිසරය
2. ■ අරියපරියේසන සූත්‍රය
3. ■ බුදුරජාණන් වහන්සේ හය වන සතියේ දී මුචලින්ද විල අසල වැඩවසන විට ඇද හැලුණු වර්ෂාවෙන් ආරක්ෂාව සැලසීමට මුචලින්ද නාගරාජයා ඉදිරිපත් වීම
4. ■ පස් වන වස් කාලය - විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි
   ■ අට වන වස් කාලය - භේෂකලා පර්වතයෙහි
5. ■ බරණැස සිට උරුවේලාවට වඩින මාර්ගයෙහි පිහිටි කැප්පෙට්ටියා ලැහැබක විවේක සුවයෙන් පසු වන විට ය.
6. ■ ලුම්බිනි සල් උයනේ දීය.
   ■ උරුවෙල් දනව්වෙහි බෝධි පර්යංකයේ දී ය.
   ■ කුසිනාරානුවර උපවත්තන සල් උයනේ දී ය.
7. ■ රජගහනුවර සීත වනයෙහි දී ය.
8. ■ ගිජ්ජකූට පර්වතයේ සූකරකත ලෙනෙහි (ඌරන් හෑරූ ලෙන) දී ය.
   ■ ඉච්ඡානංගල වනයෙහි වැඩ සිටිය දී ය.
9. ■ රජගහනුවර, නිග්‍රෝධය, චෞර ප්‍රපාතය, වේභාර පර්වත පාර්ශ්වයෙහි වූ සප්තපර්ණී ගුහාව, ඉසිගිලි පාර්ශ්වයේ කාලශිලාව, ශීතවනයෙහි වූ සප්ප සොණ්ඩික පබ්භාරය, තපෝදාරාමය, කලන්දක නිවාපි නම් වූ වේළුවනය, මද්දකුච්ඡි නම් වූ මුව වනය, ජීවකයන්ගේ අඹ උයන යන ස්ථානවල පරිසරයේ සුන්දරත්වය බුදුරජාණන් වහන්සේ අගය කළ සේක.

අන්තර්ගතය සැකසීම :- අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

10. ■ පොට්ඨපාද පිරිවැජියාගේ ආශ්‍රමයට බුදුරජාණන් වහන්සේ වැඩම කරන විට ඔහු සෙසු පිරිවැජියන් නිශ්ශබ්ද කිරීම. උස් හඬින් කතා කළහොත් බුදුරජාණන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවි යැයි ප්‍රකාශ කිරීම.

■ දෙව්රම් වෙහෙරට වැඩම කළ භික්ෂූන් පිරිසක් මහ ශබ්ද නගමින් උස් හඬින් කතා කරන විට කෙවුලන් සේ ඝෝෂා නොකොට ආරාමයෙන් පිට ව යන ලෙසට අවවාද කිරීම.

■ අජාසත් රජතුමා ඇතුළු පිරිස ජීවක අඹ උයනට එන විට එහි භික්ෂූන් වහන්සේ එක්දාස් දෙසීයක් පමණ වැඩ සිටියහ. නමුත් මේ පිරිසගෙන් කිවිසුම් හඬක් වත් නොඇසීම නිසා රජතුමා බියට පත් විය. ජීවක වෛද්‍යතුමා බුදු පාමොක් මහා සඟරුවනෝ ස්වභාවය ඒ බව පවසා රජුගේ බිය දුරු කිරීම.

■ අනවශ්‍ය ලෙස උස් හඬින් කථා කරන ප්‍රලාපයන්හි යෙදෙන මිනිසුන් සිටින තැන්වලට වැඩම කිරීම උන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම.

අන්තර්ගතය සැකසීම :- අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව

පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk